<u>විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම 2023.06.06</u>
<u>පළාත් ඉංජිනේරු කාර්යාංශය (බ.ප.)</u>

2023 වර්ෂයේ II කාර්තු වෙහි II වන විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම 2023.06.06 දින නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) කාර්යාලයේ දී පැවැත් වූ අතර එහි රැස්වීම් වාර්තාව පහත පරිදි ඉදිරිපත් කරමි.

2023.06.06 වන දින පෙ.ව.9.30 ට නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) කේ.ආර්.අබේසිරිවර්ධන මයාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වූ අතර එදින එතුමා විසින් පැමිණ සිටි සියළු නිලධාරීන් පිළිගෙන රැස්වීමේ කටයුතු ආරම්භ කෙරුණි.

<u>සහභාගී වූ නිලධාරීන්</u>

01. කේ.ආර්.අබේසිරිවර්ධන මයා - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) - පළාත් ඉංජිනේරු කාර්යාංශය (බ.ප.)
02. ආර්.ජී.හෙට්ටිආරච්චි මයා - ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති - ජාතික විගණන කාර්යාලය
03. ආර්.පී.ගුණවර්ධන මිය - අධ්‍යක්ෂ (ගොඩනැගිලි) - පළාත් ඉංජිනේරු කාර්යාංශය (බ.ප.)
04. ටී.කේ.ආර්.දිලේශිකා මිය - ප්‍රධාන ගණකාධිකාරි - පළාත් ඉංජිනේරු කර්යාලය (බ.ප.)
05. එම්.කේ.සුගත් ද සිල්වා මයා - විගණන අධිකාරී - ජාතික විගණන කාර්යාලය
06. එන්.එච්.සුමින්ද මයා - අධ්‍යක්ෂ (ගිණුම් හා ගෙවීම්) - ප්‍රධාන ලේකම් කාර්යාලය (බ.ප.)
07. ඩී.ඩී.චන්ද්‍රානි සේනවිරත්න මිය - අභ්‍යන්තර විගණක - අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව (බ.ප.)
08. පී.එල්.ඩී.ඒ.එස්.පනාගොඩ මිය - අධ්‍යක්ෂ ඉංජිනේරු - පළාත් ඉංජිනේරු කාර්යාංශය (බ.ප.)
09. ඒ.තලංගම මයා - මූලස්ථාන ඉංජිනේරු - පළාත් ඉංජිනේරු කාර්යාංශය (බ.ප.)
10. පී.ඩී,ආර්.නදීරා මිය - ප්‍රාදේශීය ඉංජිනේරු - කොළඹ.
11. එල්.පී.ධම්මිකා මිය - සහකාර විගණන අධිකාරි - . ජාතික විගණන කාර්යාලය
12. ජේ.එන්.වික්‍රමරත්න මයා - ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරි (පරිපාලන නිලධාරි රා.ආ,)- පළාත් ඉංජිනේරු කාර්යාංශය
13. ඩබ්.අයි.නිලාන්ති මෙය - මුදල් සහකාර - පළාත් ඉංජිනේරු කාර්යාංශය
14. ඩබ්.එන්.සී.කුරේ මිය - කළමනාකරණ සේවා නිලධාරි - පළාත් ඉංජිනේරු කාර්යාංශය
15. ඒ.ඒ.ඩී.ශ්‍යාමලී මිය - කළමනාකරණ සේවා නිලධාරි - පළාත් ඉංජිනේරු කාර්යාංශය
16. එල්.සී.පෙරේරා මිය - කළමනාකරණ සේවා නිලධාරි - පළාත් ඉංජිනේරු කාර්යාංශය

ප්‍රාදේශීය ඉංජිනේරුවරු මෙම රැස්වීම සඳහා Zoom තාක්‍ෂණය ඔස්සේ සම්බන්ධ වන ලදි.

1. ඒ.කේ.රුවන් අලවත්ත මයා - ප්‍රාදේශීය ඉංජිනේරු - මිගමුව.
2. එච්.ඒ.කේ.ආර්.පෙරේරා මයා - ප්‍රාදේශීය ඉංජිනේරු - හොරණ.
3. එශ්.බී.සම්පත් මයා - ප්‍රාදේශීය ඉංජිනේරු - පානදුර.
4. එච්.එස්.චන්දන මයා- ප්‍රාදේශීය ඉංජිනේරු මිනුවන්ගොඩ.
5. ආර්.ඒ.විජයප්‍රිය මයා - ප්‍රාදේශීය ඉංජිනේරු බියගම.
6. එල්.ඩී.ගලබඩ මිය - ප්‍රාදේශීය ඉංජිනේරු ගම්පහ.
7. ඒ.ඒ.ද සොයිසා මයා - ප්‍රාදේශීය ඉංජිනේරු හෝමාගම.
8. ඩබ්.ජී.ආර්.වේලාතන්ත්‍රි මයා - ප්‍රාදේශීය ඉංජිනේරු මතුගම.
9. පී.ආර්.මධුරංග මයා - ප්‍රාදේශීය ඉංජිනේරු වත්තල.
10. ජී.ඩී.විපුලසේන මිය - ප්‍රාදේශීය ඉංජිනේරු බත්තරමුල්ල.
17. එස්.එස්.මිල්ලනියගේ මිය - ප්‍රාදේශීය ඉංජිනේරු කළුතර.
18. ජේ.එල්.පෙරේරා මිය -ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරි ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය රත්මලාන.

## 01. <u>පසුගිය විගණන කමිටු වාර්තාවේ ප්‍රගතිය සාකච්ඡා කිරීම</u>

| | කාරණය | සාකච්ඡා වූ කරුණු/ තීරණ | වගකීම |
|---|---|---|---|
| 01 | මාසික බැංකු සැසඳුම් | මේ වන විට සියළුම කාර්යාල විසින් මෘදු පිටපත එවන බවත් ඒ ආකාරයෙන්ම දිගටම කරගෙන යන ලෙසත් අභ්‍යන්තර විගණක ප්‍රකාශ කරන ලදි. අදාල මස බැංකු සැසඳුම් ඊලග මස 15 දිනට පෙර විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස නි.ප්‍ර.ලේ.(ඉංජිනේරු) විසින් ප්‍රාදේශීය ඉංජිනේරුවරුන්ව දැනුවත් කරන ලදි. | ප්‍රධාන ගණකාධිකාරි / ගණකාධිකාරි සියළු ප්‍රාදේශීය ඉංජිනේරුවරු |
| 02 | අත්තිකාරම් 'බී' ගිණුමට අදාලව ණය අය නොවීම. | ණය ශේෂ එකවර පියවීමේ හැකියාවක් පළාත් පාලන ආයතන සතුව නොපවතින බැවින් පළාත් පාලන ආයතන වෙත ස්ථාන මාරු ලබා ඇති නිලධාරීන්ගේ ණය ශේෂ මාසික වාරික වශයෙන් පියවනු ලබයි. | ප්‍රධාන ගණකාධිකාරි / ගණකාධිකාරි |

| අනු අංකය | නිලධාරිගේ නම | තනතුර | ස්ථාන මාරුවී ගිය දිනය | 2023.05.31 දිනට අයවිමට ඇත ණය ශේෂය රු. |
|---|---|---|---|---|
| | පළාත් පාලන ආයතන වලට ස්ථාන මාරුවී ගිය නිලධාරින්ගෙන් අයවිය යුතු ණය ශේෂයන් | | | |
| 1 | ඒ.එස්.අමරසිංහ | කළ.සේවා. සහකාර | 2016.01.16 | 117,779.00 |
| 2 | පී.ජේ.එස්.පෙරේරා | කළමනාකරණ සහකාර | 2018.02.28 | 125,200.00 |
| 3 | එස්.එම්.වඩුගේ | කළමනාකරණ සහකාර | 2018.11.05 | 57,760.00 |
| 4 | සී.කේ.තන්තුලගේ | රියදුරු | 2019.06.03 | 101,412.00 |
| 5 | ඩබ්.ඒ.ටී.එස්. වනිගසුන්දර | කළමනාකරණ සහකාර | 2020.01.01 | .124,895.00 |
| 6 | ඩබ්.සී.එස්.පෙරේරා | කළමනාකරණ සහකාර | 2020.01.17 | 51,360.00 |
| 7 | පී.ජී.එල්.ආලෝකා | තාක්ෂණ නිළධාරි | 2020.02.10 | 144,124.00 |
| 8 | අයි.ජී.ආර්.පෙරේරා | කළමනාකරණ සහකාර | 2020.02.17 | 131,218.00 |
| 9 | එන්.පී.ඩබ්. ජයවර්ධන | සංවර්ධන නිලධාරි | 2021.12.15 | 80,839.00 |
| 10 | ඒ.එස්.ඒ.සිල්වා | තාක්ෂණ නිළධාරි | 2022.03.31 | 119,715.00 |
| 11 | ඩබ්.එස්.ළබෙවික්‍රම | කළමනාකරණ සහකාර | 2022.03.28 | 84,460.00 |
| 12 | එස්.යූ.විමලසිරි | කළමනාකරණ සහකාර | 2023.01.01 | 165,000.00 |
| | | | | **1,303,762.00** |
| | රජයට /වෙනත් පළාත් සභාවකට /පළාත් සභාවේ වෙනත් කාර්යාලයකට ස්ථානමාරුවී ගිය නිලධාරින්ගෙන් අයවිය යුතු ණය ශේෂ - විදේශධූත සේවය සඳහා | | | |

| | | | | |
|---|---|---|---|---|
| 12 | එම්.එච්.ගුණසේකර | කළමනාකරණ සේවා නිලධාරි | 2020.02.07 | 125,400.00 |
| | | | | |
| | සේවය හැර ගොස් ඇති නිලධාරින්ගෙන් අයවිය යුතු ණය ශේෂ | | | |
| 13 | ආර්.ජ්.එම්.එම්.රණසිංහ | තාක්ෂණ නිලධාරි | 2013.01.15 | 119,689.00 |
| | | නඩු පැවරීම සඳහා ගොනුව ප්‍රධාන නීති නිලධාරි විසින් නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. | | |
| | වැඩ තහනම් කර ඇති නිලධාරින්ගෙන් අයවිය යුතු ණය ශේෂ | | | |
| 14 | පී.ජ්.එල්.එස්. පෙරේරා | විදුලි කාර්මික | 2019.12.03 | 21,696.00 |

| | | | |
|---|---|---|---|
| 03 | කල් ඉකුත්වූ තැන්පතු | ඉදිකිරම් කොන්ත්‍රාත්වල අඩුපාඩු දින 10 ක් ඇතුලත අවසන් කරන ලෙස අදාළ කොන්ත්‍රාත්කරුවන් දැනුවත් කර මෙතෙක් නිදහස් නොකළ තැන්පතු මුදල් 2023.06.15 දිනට පෙර කඩිනමින් නිදහස් කිරිමට කටයුතු කරන ලෙසත් එසේ කිරිමට නොහැකි වසර දෙකට වැඩි සියළුම රැඳවුම් ආදායමට ගෙන ඒ බව ප්‍රධාන කාර්යාලයේ ගිණුම් අංශය වෙත වාර්තා කිරිමට කටයුතු කරන ලෙසත් ප්‍රාදේශීය ඉංජිනේරුවරුවන්ට නි.ප්‍ර.ලේ.(ඉංජිනේරු) විසින් දැනුවත් කරන ලදි. | නි.ප්‍ර.ලේකම් (ඉංජිනේරු) ප්‍රධාන ගණකාධිකාරී / ගණකාධිකාරී / සියලුම ප්‍රාදේශීය ඉංජිනේරු |
| 04 | මීගමුව ධීවර සමිතිය | 1. මීගමුව ධිවර සමිති ගොඩනැගිල්ල පළාත් සභාව සතු දේපලක් බැවින් එම දේපල පවරා ගැනිමට අදාල කටයුතු සිදු කිරිම සඳහා ප්‍රාදේශීය ලේකම්වරුන් සමඟ පවත්වනු ලබන සාකච්ඡාවට මෙම ගැටළුව සම්බන්ධ කරුණු ඉදිරිපත් කර ඉදිරි ක්‍රියා මාර්ග ගැනිමට තිරණය විය. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) / පරිපාලන නිලධාරි(රා.ආ)/ මීගමුව ප්‍රාදේශීය ඉංජිනේරු |
| | අවිස්සාවේල්ල ඉඩම | 2. අවිස්සාවේල්ල සබරගමුව බස් සමාගම බදු දී ඇති ඉඩම සහිත ගොඩනැගිල්ල සම්බන්ධයෙන් ප්‍රධාන ලේකම් (බ.ප.) සමඟ සාකච්ඡාකර ඉදිරි කටයුතු කිරිමට තිරණය විය. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) / පරිපාලන නිලධාරි හෝමාගම ප්‍රාදේශීය ඉංජිනේරු |
| 05 | ලිපිගොනු කළමනාකරණ ක්‍රියාවලිය සම්බන්ධ මෘදුකාංග පද්ධතිය (DMS) | මෙම මෘදුකාංග පද්ධතියේ තවදුරටත් ගැටළුකාරි තත්ත්වයන් පවතින බැවින් ඒ සම්බන්ධයෙන් අදාල ආයතනය සමඟ දිගින් දිගටම සාකච්ඡාවන් පැවැත්වුව ද මෙම මෘදුකාංග පද්ධතියයේ තවදුරටත් ගැටළුකාරි තත්ත්වයන් ඇති බව අධ්‍යක්ෂ ඉංජිනේරු පැහැදිලි කරන ලදි.<br><br>මෙම මෘදුකාංග පද්ධතිය සකසනු ලබන EPIC ආයතනය හා ITRD ආයතනය සමඟ මෙම ගැටළුකාරි තත්ත්වය සම්බන්ධයෙන් සාකච්ඡාකර අවසන් තිරණයක් ගැනිමට තිරණය විය | නි.ප්‍ර.ලේ. ඉංජිනේරු/ අධ්‍යක්ෂ ඉංජිනේරු / ගොඩනැගිලි අධ්‍යක්ෂ |

| | | | |
|---|---|---|---|
| 06 | වාහන පරිපාලනය සම්බන්ධ | 1. වාහනවල මාසික ධාවන සටහන් සාරාංශය මාස්පතා පරීක්ෂා කර ඊලග මස 05 දිනට පෙර නියමිත පරිදි රජයේ විගණක වෙත ඉදිරිපත් කිරිම.<br><br>2. III වන විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම පැවැත්වීමට පෙර ර.ප.ච.ලේඛ 30/2016 හි 3.1 පරිච්ඡේදය ප්‍රකාරව ඉන්ධන පරීක්ෂාව සිදු කිරිම.<br><br>3. ඉන්ධන ඇණවුම් කිරිමේදි ධාවන සටහන් පොත් නිසි පරිදි ඉන්ධන තුලනය කර ඇද්ද යන්න පරීක්ෂා කර ඉන්ධන ඇණවුම් නිකුත් කිරිම.<br><br>4. රාජ්‍ය ලාංඡනය ප්‍රදර්ශනය නොවන සියළුම රජයේ වාහන වල රාජ්‍ය ලාංඡනය ප්‍රදර්ශනය කිරිමට කඩිනමින් ක්‍රියාමාර්ග ගැනීම.<br><br>5. වාහන අළුත්වැඩියාවන් කිරිමේදි යොදනු ලබන අමතර කොටස් සම්බන්ධයෙන් මීට පෙර සිදු කරන ලද අළුත්වැඩියාවන් ද පරීක්ෂාකර නි.ප්‍ර.ලේ (ඉංජිනේරු) ගේ අනුමැතිය යටතේ සිදු කරන ලෙස<br><br>ඉහත කරුණු සම්බන්ධයෙන් ප්‍රධාන කාර්යාලයේ හා සියළුම ප්‍රාදේශීය කාර්යාලවල විෂයභාර නිලධාරින් සහ රියදුරන් දැනුවත් කරන ලෙස නි.ප්‍ර.ලේ.(ඉංජිනේරු) විසින් සියළුම ප්‍රාදේශීය ඉංජිනේරුවරුන්ට හා පරිපාලන නිලධාරි (රා.ආ.) දැනුවත් කරන ලදි. | සියළු ප්‍රාදේශීය ඉංජිනේරුවරු/ පරිපාලන නිලධාරි |
| 07 | කාර්යාල නිල ඇඳුම් | නිල ඇඳුමින් රාජකාරි වේලාව තුල සේවයේ යෙදි සිටිය යුතු සියළුම කාර්ය මණ්ඩලය ආයතන සංග්‍රහයේ XXI වන පරිච්ඡේදයෙන් ලබා දි ඇති උපදෙස් ප්‍රකාරව සේවයේ නොයෙදෙන්නේ නම් එම සේවකයින්ගේ නමටම ලිපි නිකුත් කිරිම | සියළුම ප්‍රාදේශීය ඉංජිනේරු /පරිපාලන නිලධාරි |
| 08 | ව්‍යාපෘති සඳහා අග්‍රිම ඉල්ලුම් කිරිම | PSSP, PDG, GEMP ව්‍යාපෘතිහි ඉදිකිරිම් ප්‍රගතිය පෙන්නුවද මූල්‍ය ප්‍රගතිය 15% වැනි අඩු ප්‍රතිශතයක් පෙන්නුම් කරන බවත් එබැවින් මෙම ව්‍යාපෘතිහි ඉදිකිරිම් කොන්ත්‍රාත් කරුවන්ට අත්තිකාරම් මුදල් ගැනිමට උනන්දු කරවන ලෙසත්, අවසන් කර ඇති වැඩ සඳහා කොටස් වශයෙන් ගෙවීම් සිදු කර මූල්‍ය ප්‍රගතිය වැඩි කර ගැනිමට කටයුතු කරන ලෙස භාණ්ඩාගාර නියෝජිත අධ්‍යක්ෂ (ගිණුම් හා ගෙවීම්) පැහැදිලි කරන ලදි. නි.ප්‍ර.ලේ.(ඉංජිනේරු) විසින් සියළුම ප්‍රාදේශීය ඉංජිනේරුවරුන්ට දැනුවත් කරන ලදි. | ප්‍රධාන ගණකාධිකාරි / ගණකාධිකාරි සියළුම ප්‍රාදේශීය ඉංජිනේරුවරු |

**2 ) ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපතිගේ හා විගණන අධිකාරිගේ අදහස් හා පැහැදිලි කිරිම්**

| | මතුකළ කරුණු |
|---|---|
| 1 | ඩ්‍රෝනා යානා 02 ක් ඉංජිනේරු කාර්යාංශය මගින් මිලදි ගෙන ඇති අතර එම යානා 02 න් ඩෙංගු මර්ධන කටයුතු සිදු කරනු ලබයි. එබැවින් සඳහා සේවය ලබා ගන්නේ සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් බවත් එම නිසා එම වත්කම සෞඛ්‍ය අමාත්‍යාංශට පැවරිම සුදුසු බවට කරුණු පැහිදිලි කිරිමක් සිදු කරන ලදි. |
| 2 | යානාව ගුවන්ගත කළ දිනය, වේලාව, පරීක්ෂා කරන ලද ප්‍රදේශය එහි වර්ග ප්‍රමාණය, ගුවන් ගත කල කාලය, එම අවස්ථාවේ රාජකාරියේ නියලි සිටි නිලධාරින්, ගුවන් ගත කල නිලධාරියා යන කරුණු ඇතුලත්ව යානා 02 න් සිදු කරන කාර්ය භාරය පිළිබඳව දෛනිකව වාර්තාවන් ලබා ගැනිම, |
| 3. | නව දුරටත් වසර දෙක ඉක්මවා පවතින රැඳවුම් මුදල් කඩිනමින් අවසන් කිරිමට කටයුතු කරන ලෙසත්, |

(3) අධ්‍යක්ෂ අභ්‍යන්තර විගණනකගේ අදහස් හා පැහැදිලි කිරීම්

| | මතුකළ කරුණු |
|---|---|
| 1 | බැංකු සැසඳුම් ඉදිරිපත් කිරීම ඉතාම සතුටු දායක බව. |
| 2. | මේවන විට ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලවල මාස අවසානයේ මුදල් පොතේ ශේෂය සතුටු දායක ලෙස පවත්වාගෙන යන බව. |
| 3. | ලිපිගොනු කළමනාකරණ ක්‍රියාවලිය සම්බන්ධ මෘදුකාංග පද්ධතිය (DMS) හා Complain Management මෘදුකාංගයන් සඳහා විශාල වියදමක් දරා ඇතත් එහි ප්‍රතිඵලයක් තවම නොමැති බවත්. ඒ සඳහා කඩිනමින් ඉදිරි කටයුතු සිදු කිරීම. |
| 4. | හොරණ ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයට අදාල බප/හො හඳපාන්ගොඩ මහ විද්‍යාලයේ නල ළිඳ තවම අවසන් කර නොමැති බවත්, හොරණ මොරගහහේන මධ්‍යමහා විද්‍යාලයේ නව ගොඩනැගිල්ලේ ටයිල් ගැලවී ඇති බවත් . |

අධ්‍යක්ෂ - ගිණුම් හා ගෙවීම්ගේ අදහස් හා පැහැදිලි කිරීම්

| | මතුකළ කරුණු |
|---|---|
| 1 | අග්‍රිම ඉල්ලුම් කිරීම සඳහා නව ගුගල් ආකෘතියක් හඳුන්වා දී ඇති අතර ඒ ආකෘතිය සම්පූර්ණ කර අග්‍රිම ඉල්ලුම් පත භාණ්ඩාගාරයට එවීමට කටයුතු කරන ලෙස |
| 2. | ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති බ්‍රෝෂා ග්‍රන්ථ 02 හි සේවාව සම්බන්ධයෙන් පෙන්වා දුන් තොරතුරු ආකෘතියක් සකස් කර මාසිකව වාර්තාවක් ලබා ගැනීම සුදුසු බව |
| 3. | ප්‍රසම්පාදන ලියවිලි සැකසීමේදී ඉතාමත්ම සැලකිල්ලෙන් කටයුතු කරන ලෙස |
| 4. | PSSP වාර්ත මාසිකව නියමිත දිනට භාණ්ඩාගාර වෙත යොමු කරන ලෙස, පොත් හා සැසඳීම් කිරීමේදී ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලවල වියදම් හා ලැබීම්ද සමඟ සැසඳීම සිදු කළ යුතු බව |
| 5. | වාහන සඳහා ඉන්ධන නිකුත් කිරමේදී ඉන්ධන තුලනය කිරීම පරීක්ෂා කරන ලෙස, වාහන විෂයභාර නිලධාරි/ අධීක්ෂණ නිලධාරි විසින් මාසකට වරක්වත් වාහනය පරීක්ෂා කර බැලිය යුතු බව |

විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම පැවැත්වීම ඉතා වැදගත් බවත්, විගණනයෙන් ලබාදෙන ලද වටිනා අදහස් රාජකාරි කටයුතු වලදී ඉතා ප්‍රයෝජනවත් බවත්, ඔබගේ වටිනා කාලය වැයකර මෙම රැස්වීම සඳහා සහභාගි වීම සම්බන්ධයෙන් ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති, විගණන අධිකාරි, අධ්‍යක්ෂ - අභ්‍යන්තර විගණක, අධ්‍යක්ෂ - ගිණුම් හා ගෙවීම්, සියළුම ප්‍රාදේශීය ඉංජිනේරුවරුන්ට හා අනෙකුත් සහභාගි වූ සියළු නිලධාරීන්ට නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) ස්තූතියඵල කිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු පස්වරු 12.15 ට පමණ අවසන් කරන ලදි.

කේ.ආර්.අබේසිරිවර්ධන මයා
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු),
පළාත් ඉංජිනේරු කාර්යාංශය,
බස්නාහිර පළාත.

ඉංජි. කේ.ආර්. අබේසිරිවර්ධන
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)
ඉංජිනේරු කාර්යාංශය (බ.ප.)